ආබාධ සහිතව ජීවත් වන පුද්ගලයින් හට සමාජය තුළ වෙනස්කම් හෝ කොන් කිරීම් වලින් තොරව ජීවත්වීමට හැකි වීම අත්‍යවශ්‍ය කාරණයකි. ඒ සඳහා ගර්හා විරහිත, කොන් නොකෙරෙන සහ ගරුත්වය රැකෙන භාෂා භාවිතයක් ඔස්සේ ඔවුන්ව හැඳින්වීම ද අවශ්‍ය කරුණකි.

The Island පුවත්පතේ (මැයි 21, 2022) "Persons with disabilities educated on their rights" යන සිරස්තලය සමඟ පළවී ඇති ලිපියකි. ආබාධ සහිත වූවන් පිළිබඳ වාර්තාකරණයේදී වඩාත් ආචාර ධාර්මික ප්‍රවේශයක් ගත හැක්කේ කෙසේදැයි පෙන්වා දීම සඳහා මෙම ලිපියේ ඇති ගැටළුකාරී තැන් නිදසුන් ලෙසින් සාකච්ඡාවට ගත හැක.

1) වත්මන් සංගණන වාර්තාවන්ට අනුව ශ්‍රී ලංකාවේ ආබාධ සහිතව ජීවත් වන ජනගහණය මිලියන 1.8 ක් යැයි ලිපිය තුළ සඳහන් කොට තිබේ. කෙසේ නමුත්, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට ඇති වඩාත්ම යාවත්කාලීන සංගණන වාර්තාව (2012) අනුව විමසා බලන්නේ නම්, මෙම සංඛ්‍යාව මිලියන 1.6 කට මදක් වැඩි වේ.

2) ආබාධ සහිත වූවන් හැඳින්වීම සඳහා පුද්ගල මූලික භාෂාවක් (Person-first language) වඩාත් යෝග්‍ය වන්නේය යන මාධ්‍ය මාර්ගෝපදේශනය සමගින් ගත් විට, 'disabled' යන හැඳින්වීම වෙනුවට 'a person with a disability' යන්න වඩාත් යෝග්‍ය වේ යැයි සඳහන් කළ හැක.

3) යල් පැන ගිය හා ආබාධ සහිත වූවන්ව කොන් කිරීමකට ලක් කරනා, "Handicapped", "Mentally retarded" වැනි යෙදුම් භාවිතයෙන් බැහැර කිරීම වඩාත් යෝග්‍ය වේ.

කෙසේ නමුත්, The Island පුවත්පතේ වෙබ් සංස්කරණයේ පළ වී ඇති මෙම ලිපියේ ඉහත 2 සහ 3 කරුණු වලට අදාළ කොටස් ඉවත් කෙරී ඇති බවද මෙසේම සඳහන් කළ යුතු වේ. (https://island.lk/persons-with-disabilities-educated.../...)

මූලාශ්‍ර:
www.aucd.org/docs/add/sa_summits/Language%20Doc.pdf
https://cdrnys.org/.../the-disability-dialogue-4.../
https://unstats.un.org/.../bang.../Session-6/Sri%20Lanka.pdf